පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1995 නොවැම්බර් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 16.00 තැපැල් ගාස්තුව : රු. 7.50

: 1999

නැවත මුද්‍රණය : 2001

නැවත මුද්‍රණය - 2006

නැවත මුද්‍රණය - 2007

2010

# 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 ඔක්තෝබර් මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 3/95

දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1995 අංක 22 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

19 වන අධිකාරයේ 286අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) දණ්ඩ නීති සංග්‍රහයේ 286 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 286අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:

"ළමයින් ට අදාළව කරනු ලබන අසභ්‍ය පළ කිරීම, ප්‍රදර්ශන ආදිය.

286අ. (1) පහත සඳහන් යම් ක්‍රියාවක් සිදු කරන එනම්:—

(අ) යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ, යම් අසභ්‍ය හෝ අශ්ලීල ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, එහි නිරූපණයක් කිරීමට හෝ පෙනී සිටීමට, යම් ළමයකු කුලියට ගන්නා හෝ සේවයෙහි නියුක්ත කරන, එහි ලා උපකාර කරන, ඒ සඳහා කැමති කරවා ගන්නා, යොදවන, පොළඹවන හෝ බල කරන හෝ එවැනි යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් විකුණන හෝ බෙදාහරින නැතහොත් අත්‍යාකාරයකින් පළ කරන හෝ තම සන්තකයෙහි තබා ගන්නා කවර හෝ තැනැත්තකු; හෝ

(ආ) ළමයකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, භාරකරුවකු හෝ ඒ ළමයාගේ භාරකාරත්වය දරන තැනැත්තකුව සිටිමින්, යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක සේවයෙහි නියුක්ත කිරීමට හෝ එවැන්නකට සහභාගි වීමට හෝ (අ) ඡේදයෙහි සඳහන් අන්දමේ යම් ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරන ලැබීමට, නිරූපණය කිරීමට හෝ පෙනී සිටීමට ඒ ළමයාට සලස්වන හෝ ඉඩ දෙන කවර හෝ තැනැත්තකු; හෝ

57—2,000(2010/09)

ගන්නා හෝ ගැනීමට උපකාර කරන කවර හෝ තැනැත්තකු; හෝ

(ආ) (i) ළමයකුගේ යම් අශ්ලීල ඡායාරූපයක්

(ii) එවැනි යම් ඡායාරූපයක් බෙදාහරින හෝ පෙන්වන හෝ එවැනි යම් ඡායාරූපයක් සහිත යම් පළ කිරීමක් බෙදාහරින හෝ පෙන්වන කවර හෝ තැනැත්තකු; හෝ

(iii) එවැනි යම් ඡායාරූපයක් හෝ පළ කිරීමක් බෙදාහැරීම සඳහා හෝ පෙන්වීම සඳහා තම සන්තකයෙහි තබාගෙන සිටින කවර හෝ තැනැත්තකු; හෝ

(iv) එවැනි යම් ඡායාරූපයක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන හෝ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන්නා හෝ ඒ ප්‍රචාරක දැන්වීමේ නම් සර ඇති තැනැත්තා එවැනි යම් ඡායාරූපයක් හෝ පළ කිරීමක් බෙදාහරින තැනැත්තෙක් පෙන්වන තැනැත්තකු හෝ එසේ කිරීමට අදහස් කරන තැනැත්තකු ය යන ඇඟවුම දීමට හැකි වන ආකාරයේ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන කවර හෝ තැනැත්තකු

"ළමයින්ට අදාළව අසභ්‍ය පළ කිරීම් සහ ප්‍රදර්ශනය පිළිබඳ වරද. සිදු කරන අතර, ඒ තැනැත්තා වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය: තව ද, ඒ තැනැත්තාට දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ—

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු අදහස් වේ; සහ

"චිත්‍රපටය" යන්නට කවර හෝ ආකාරයක වීඩියෝ පටිගත කිරීමක් ඇතුළත් වේ.".



**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 308 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 308අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 308 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ළමයින් කෲරත්වයට භාජනය කිරීම.

308අ. (1) වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරා සිටිමින්, ඒ තැනැත්තාට වේදනාවක් හෝ ඔහුගේ සෞඛ්‍යයට හානියක් සිදු විය හැකි ආකාරයට, (ඇස් පෙනීමට හෝ කන් ඇසීමට හෝ ශරීරයේ අවයවයකට හෝ ඉන්ද්‍රියකට සිදු කරන යම් තුවාලයක් හෝ, ඇස් පෙනීමෙහි ලා හෝ කන් ඇසීමෙහි ලා සිදු කරන ලද යම් හානියක් හෝ යම් මානසික ව්‍යාකූලතාවක් ඇතුළුව, ඕනෑකමින්ම, ඒ තැනැත්තාට අඩත්තේට්ටම් කරන, හිංසා කරන, නොසලකා හරින හෝ අතරමං කරන හෝ ඒ තැනැත්තාට අඩත්තේට්ටම් කරනු ලැබීමට, හිංසා කරනු ලැබීමට, නොසලකා හරිනු ලැබීමට හෝ අතරමං කරනු ලැබීමට සලස්වන හෝ කුමන්ත්‍රණය කරන කවර හෝ තැනැත්තෙක් ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරන්නේ ය.

(2) ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරන කවර හෝ තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය. තව ද, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 311 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.— ප්‍රධාන ප්‍රඥප්තියේ 311 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"බරපතළ තුවාල.

311. පහත දැක්වෙන තුවාල පමණක් "බරපතළ තුවාල" ලෙස නම් කරනු ලැබේ.—

(අ) අපුංසකභාවය;

(ආ) දෙඇසින් එක් ඇසක හෝ පෙනීම සදහටම නැති කිරීම හෝ දුර්වල කිරීම;

(ඇ) දෙකණින් එක් කණක හෝ ඇසීම සදහටම නැති කිරීම හෝ දුර්වල කිරීම:

(ඈ) යම් අවයවයක හෝ සන්ධියක ක්‍රියාකාරිත්වය නැති කිරීම;

(ඉ) යම් අවයවයක හෝ සන්ධියක ශක්තිය විනාශ කිරීම හෝ සදහට ම දුර්වල කිරීම;

(ඊ) හිස හෝ මුහුණ සදහට ම විරූප කිරීම;

(උ) අස්ථියක්, කාටිලේජ හෝ දතක් කැපීම හෝ භංග කිරීම හෝ අස්ථියක්, කාටිලේජයක් හෝ දතක් අවසන්ධි කිරීම;

(ඌ) ජීවිතයට අන්තරායකාරී වන යම් තුවාලයක් හෝ, යම් තුවාලයක ප්‍රතිඵලයක් වශයෙන් උරස්, උදර හෝ කපාල කුහර විවෘත කිරීමට සිදු වන ශල්‍ය කර්මයක් සිදු කරනු ලැබේ ද, එවැනි තුවාලයක්;

(එ) යම් තුවාලයක් හේතුකොට ගෙන හෝ යම් තුවාලයක් නිසා කළ යුතු වූ ශල්‍ය කර්මයක් හේතුකොට ගෙන, දින විස්සක කාලයක් තදබල ශාරීරික වේදනා විඳීමට සිදු කැරෙන හෝ තමාගේ සාමාන්‍ය කටයුතුවල නිරතවීමට නොහැකි වන අන්දමේ යම් තුවාලයක්.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 345 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 345 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

"ලිංගික අතවර කිරීම.

345. අවන්තේරුවම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදු කරන කවර හෝ තැනැත්තකු, ලිංගික අතවර කිරීමේ වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින් ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය; තව ද ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ද ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි ය.



පැහැදිලි කිරීම.

1. වැඩ කරන ස්ථානයක බලය දරන තැනැත්තකු විසින් වැඩ කරන ස්ථානයක දී හෝ වෙනත් යම් ස්ථානයක දී වචනයෙන් හෝ ක්‍රියාවෙන් කරනු ලබන අනනුදාත ලිංගික ප්‍රයත්නවලින් ලිංගික අතවර කිරීමේ වරද සංයුක්ත වන්නේ ය.

2. මේ වගන්තියේ කාර්ය සඳහා, අවන්තේරුවම් කිරීමකට 363 වන වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය බවට පත් නොවන යම් ක්‍රියාවක් ඇතුළත් විය හැකි ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 350 වන වගන්තියට ඉහළින් ඇති ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ:— ("අපහරණය, පැහැර ගෙන [illegible]" යන ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.)

"අපහරණය සහ පැහැරගෙනයාම".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 360අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 360අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

"කුට්ටනය.

360අ. (1) කවර වූව ද වයසක සිටින පුරුෂ හෝ ස්ත්‍රී යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගණිකාවක් බවට පත් කිරීමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන;

(2) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොටගෙන වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කිරීම හෝ කුට්ටනය කිරීමට තැත් කරන හෝ, එකී කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන;

(3) කවර වූවද වයසක සිටින යම් තැනැත්තකු අන්‍ය දේශයක ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත් කිරීමේ චේතනාවෙන් (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ඒ තැනැත්තාට ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන හෝ ඒ කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන;

(4) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොට ගෙන වයස අවුරුදු දහසයට අඩු යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ගෙන ඒමට තැත් කරන;

(5) ගණිකා වෘත්තිය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත් කිරීමේ චේතනාවෙන් කවර වුව ද වයසක සිටින යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ ගණිකා නිවාසයක් නොවූ) සුපුරුදු වාසස්ථානය මෙ කාමට කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන;

(6) යම් තැනැත්තකු අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ ලිංගික අපචාරයකට පාත්‍ර කිරීම අරමුණු කොට ගෙන ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ගණිකා නිවාසයක රඳවා තබා ගන්නා

යම් තැනැත්තකු "කුට්ටනය" කිරීමේ වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු දහයක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කළ යුතු ය. තව ද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 360අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 360ආ සහ 360ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියේ 360 ආ සහ 360ඇ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ළමයින් ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම.

360ආ. (1) පහත දැක්වෙන ක්‍රියාවල යෙදෙන, එනම්:—

(අ) යම් ළමයකු ලිංගික අපයෝජනයට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැත හොත් දර්ශනයකට ළමයකු සහභාගි කරවා ගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩ දෙන;

(ආ) ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකු කට්ටනය කරන්නකු වශයෙන් ක්‍රියා කරන;





(ඇ) මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සංනිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම් මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකුගේ සේවාදායකයකු වීමට, යම් තැනැත්තකු පොළඹවන;

(ඈ) ළමයකු කෙරෙහි තමා දරන වගකීම බලපෑම හෝ ළමයකු විෂයයෙහි තමාට ඇති භාර සම්බන්ධතාව ඒ ළමයා ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා;

(ඉ) ළමයකු, ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා ඒ ළමයා කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන;

(ඊ) යම් ළමයකු ලිංගික සංසර්ගයෙහි යෙදවීමේ හෝ කවර වුව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමව්පියන්ට මුදලින් ප්‍රතිඥාවක්, භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබා දෙන

කවර හෝ තැනැත්තකු "ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද" සිදු කරනු ලබන අතර ඒ තැනැත්තා වරදකරු කරනු ලැබුවිට අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය. තව ද දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ "ළමයා" යන්නෙන් වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.

360ඇ. (1) පහත සඳහන් යම් ක්‍රියාවක් සිදු කරන, එනම්—

(අ) මුදලට හෝ වෙනත් යම් ප්‍රතිඥාවක් සඳහා හෝ යම් තැනැත්තකු මිලට ගැනීමේ, විකිණීමේ හෝ වෙනත් යම් දෙයකට මාරු කිරීමේ යෙදෙන ;

(ආ) මුදලට හෝ වෙනත් යම් ප්‍රතිඥාවක් සඳහා හෝ යම් තැනැත්තකු මිලට ගැනීම හෝ විකිණීම හෝ වෙනත් යම් දෙයකට මාරු

කිරීම හෝ දරුකමට හදා ගැනීමට දීම හෝ ප්‍රවර්ධනය කිරීමේ තැතහොත් පහසු කර ලීමේ හෝ එහි ලා පෙළඹවීමේ කාර්යය සඳහා—

(i) යම් ළමයකුගේ දෙමව්පියන්ගෙන් කෙනකුගේ හෝ නීත්‍යනුකූල භාරකරුගේ කැමැත්ත නොමැතිව විදේශීය රටකට ගමන් කිරීම පිණිස ඒ ළමයාට කටයුතු පිළියෙළ කර දෙන හෝ සහාය වන; හෝ

(ii) යම් ගර්භනී ස්ත්‍රියකගේ නූපන් දරුවා දරුකමට හදා ගැනීම පිණිස ඒ ස්ත්‍රියගේ කැමැත්ත ප්‍රකාශ කරන දිවුරුම් ප්‍රකාශයක් මුදලට හෝ වෙනත් ප්‍රතිඥාවක් සඳහා ඒ ස්ත්‍රියගෙන් ලබා ගන්නා; හෝ

(iii) දරුවන් බිහි කිරීමට ස්ත්‍රීන් හෝ ජෝඩු බඳවා ගන්නා ; හෝ

(iv) උප්පැන්න ලියාපදිංචි කිරීමට යම් බන්ධ තැනැත්තකුව සිටිමින් යම් උප්පැන්න වාර්තාවක් හෝ ලේඛනයක් සාවද්‍ය ලෙස සකස් කිරීමට දැන දැනම ඉඩ දෙන ; හෝ

(v) රෝහල්වලින්, කාන්තා රක්ෂණ ස්ථානවලින්, චිකිත්සාගාරවලින්, ළදරු නිවාසවලින්, දිවා සරණ මධ්‍යස්ථානවලින් හෝ ළමයින් රැකබලාගන්නා වෙනත් ආයතන වලින් හෝ සුභ සාධන මධ්‍යස්ථානවලින් මුදලට හෝ වෙනත් ප්‍රතිඥාවක් සඳහා ළමයින් කුට්ටනය කිරීමේ යෙදී සිටින හෝ ළමයාගේ මව හෝ වෙනත් තැනැත්තකු තිය ගැන්වීමෙන් එවැනි යම් ආයතනයකින් හෝ මධ්‍යස්ථානයකින් ළමයකු දරුකමට හදා ගැනීම පිණිස කුට්ටනය කිරීමේ යෙදී සිටින; හෝ

(vi) ළමයකුගේ මව වශයෙන් වංචනීය ලෙස පෙනී සිටින හෝ එසේ පෙනී සිටීමෙහි ලා සහාය වන

කවර හෝ තැනැත්තකු, "තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ" වරද සිදු කරන අතර, වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු විස්සක්



නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකිය. ඒ වරද ළමයකු සම්බන්ධයෙන් සිදු කර ඇති අවස්ථාවක අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ "ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙක් අදහස් වේ.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 361 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියේ 361 වන වගන්තිය ඉවත් කිරීම.)*

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 362 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. *(ප්‍රධාන ප්‍රඥප්තියේ 362 වන වගන්තිය ඉවත් කිරීම.)*

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 363 වන වගන්තියට ඉහළින්ම ඇති ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :— *("ස්ත්‍රී දූෂණය" යන ශීර්ෂ පාඨය ප්‍රතිස්ථාපනය කිරීම.)*

"ස්ත්‍රී දූෂණය සහ ව්‍යභිචාරය".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 363 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— *(ප්‍රධාන ප්‍රඥප්තියේ 363 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.)*

"ස්ත්‍රී දූෂණය

363. යම් මිනිසෙක් පහත විස්තර කර ඇති අවස්ථා අතරින් යම් අවස්ථාවකට, අයත් වන පරිවේෂණ යටතේ, ස්ත්‍රියක සමග මෛථුනයෙහි යෙදේ නම් ඔහු "ස්ත්‍රී දූෂණය" සිදු කළේ යයි කියනු ලැබේ :—

(අ) ඒ ස්ත්‍රිය තමාගේ භාර්යාව වන අවස්ථාවක වුව ද ඇය ඔහුගෙන් නීති මාර්ගයෙන් වෙන් වී සිටිය දී ඇගේ කැමැත්ත නොමැතිව ;

(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන් හෝ තර්ජනය කිරීමෙන් හෝ බියගැන්වීමෙන් හෝ ඇයට මරණ භය හෝ තුවාල සිදු කිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඇය නීති

විරෝධී ලෙස රඳවා ගෙන සිටියදී හෝ ඇගේ කැමැත්ත ලබා ගෙන ඇති විට, ඇගේ කැමැත්ත ඇතිව;

(ඇ) ඇය සිහිවිකලව සිටිය දී හෝ ඒ පුරුෂයා විසින් හෝ නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් ඇයට දෙන ලද මද්‍යසාර හෝ මත්ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඇය සිටිය දී, ඇගේ කැමැත්ත ඇතිව;

(ඈ) තමා ඇගේ ස්වාමිපුරුෂයා නොවන බව ඒ පුරුෂයා දැන සිටි අතර ඇගේ කැමැත්ත දෙන ලද්දේ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී සිටින හෝ ඇය හා නීත්‍යානුකූලව විවාහ වී ඇතැයි ඇය විශ්වාස කරන වෙනත් පුරුෂයකු ඒ පුරුෂයා යයි ඇය විශ්වාස කිරීම නිසා බව ඒ පුරුෂයා දන්නා විටක දී, ඇගේ කැමැත්ත ඇතිව;

(ඉ) ස්ත්‍රිය වයස අවුරුදු දොළහට වැඩි වන්නා වූ ද එම පුරුෂයාගේ භාර්යාව වන්නා වූ ද සහ ඇය එම පුරුෂයාගෙන් නීතිය මගින් වෙන් වී නොමැති නම් මිස, ස්ත්‍රිය වයස අවුරුදු දහසයට අඩු වන විට ඇයගේ කැමැත්ත ඇතිව හෝ නැතිව.

පැහැදිලි කිරීම :—

(i) ස්ත්‍රී දූෂණය කිරීමේ වරදට අවශ්‍ය මෛථුනය සංයුක්ත වීම සඳහා ප්‍රවේශනය ප්‍රමාණවත් වේ;

(ii) ශරීරයට සිදු වී ඇති ශාරීරික තුවාල වැනි ප්‍රතිරෝධය නැම පිළිබඳ සාක්ෂි මෛථුනය සිදු කර ඇත්තේ කැමැත්ත නොමැතිව බව ඔප්පු කිරීම සඳහා අත්‍යවශ්‍ය නොවේ.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 364 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ස්ත්‍රී දූෂණයට දඬුවම්.

364. (1) ස්ත්‍රී දූෂණය සිදු කරන යම් හෝ තැනැත්තකුට, (2) වන හා (3) වන උපවගන්ති වල විධිවිධාන බලපවත්වන ඇති අවස්ථාවල දී හැර අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු අතර, රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට ද, ඔහු යටත් විය යුතු ය. තවද ඊට



අමතරව, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක්, ඒ තැනැත්තාට ගෙවනු ලෙස ද අධිකරණය විසින් අණ කරනු ලැබිය යුතු ය.

(2) යම්වර හෝ තැනැත්තකු,—

(අ) රජයේ නිලධරයකුව හෝ බලය ඇති තත්ත්වයක් දරන තැනැත්තකුව සිටිමින් තමාගේ නිල තත්ත්වය ප්‍රයෝජනයට ගෙන තමාගේ නිල රැකවරණයෙහි සිටින ස්ත්‍රියක් දූෂණය කළහොත් හෝ අයතු ලෙස අවහිර කර ස්ත්‍රියක් දූෂණය කළහොත්;

(ආ) නීතිය මගින් හෝ නීතිය යටතේ හෝ පිහිටුවන ලද රක්ෂණ නිවාසයක හෝ අත්අඩංගුවේ තබා ගන්නා වෙනත් ස්ථානයක නැතහොත් කාන්තා හෝ ළමා ආයතනයක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියුතු තැනැත්තකුව සිටිමින්, තමාගේ තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ඒ රක්ෂණ නිවාසයේ, ස්ථානයේ හෝ ආයතනයේ නේවාසික යම් ස්ත්‍රියක් දූෂණය කළහොත්;

(ඇ) රෝහලක කළමනාකරණ පක්ෂයේ හෝ කාර්ය මණ්ඩලයේ නියතු තැනැත්තකුව සිටිමින් තමාගේ තත්ත්වය ප්‍රයෝජනයට ගෙන ඒ රෝහලේ යම් ස්ත්‍රියක් දූෂණය කළහොත්;

(ඈ) යම් ස්ත්‍රියක් ගර්භණී බව දැන දැනම ඇය දූෂණය කළහොත්;

(ඉ) වයස අවුරුදු දහඅටකට අඩු ස්ත්‍රියක් දූෂණය කළහොත්;

(ඊ) මානසික වශයෙන් හෝ ශාරීරික වශයෙන් ආබාධිත ස්ත්‍රියක් දූෂණය කළහොත්;

(උ) රංචු ගැසී ස්ත්‍රී දූෂණය කළහොත්

ඒ තැනැත්තාට අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීමකින් ද දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතුය. තවද, ඊට අමතරව, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය

කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, වයස අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් ඒ වරද සිදු කොට ඇති අවස්ථාවක, වරද සිදු කළ තැනැත්තා වයස අවුරුදු දහ අටකට අඩු තැනැත්තකු වන සහ සංසර්ග සිදු කොට ඇත්තේ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ඇතිව වන අවස්ථාවක, අවුරුදු දහයකට අඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඩුවමක් අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි ය.

නිදර්ශන කිරීම 1—

තැනැත්තන් කණ්ඩායමක එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් විසින් ස්ත්‍රී දූෂණය පිළිබඳ වරද සිදු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද සිදු කළ හෝ වරද සිදු කිරීමෙහි ලා අනුබල දුන් ඒ කණ්ඩායමේ එක් එක් තැනැත්තා, රංචු ගැසී ස්ත්‍රී දූෂණය සිදු කළේ යයි සලකනු ලැබේ.

නිදර්ශන කිරීම 2—

"කාන්තා හෝ ළමා ආයතනය" යන්නෙන්, කවර ආකාරයකින් විස්තර කරනු ලබන්නේ වුව ද ස්ත්‍රීන් සහ ළමයින් භාර ගැනීම සහ රැක බලා ගැනීම සඳහා වූ ආයතනයක් අදහස් වේ.

නිදර්ශන කිරීම 3—

"රෝහල" යන්නෙන් රෝහලේ සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර රෝගෝපගතව සිටින තැනැත්තන් හෝ වෛද්‍ය උපස්ථානය හෝ පුනරුත්ථාපනය අවශ්‍ය තැනැත්තන් භාර ගැනීම සහ ඔවුන්ට ප්‍රතිකාර කිරීම සඳහා වූ යම් ආයතනයක සීමාව ඇතුළත පිහිටි ප්‍රදේශය ද එයට ඇතුළත් වේ.

(3) 364 වන වගන්තියෙහි වෙන් වෙන් වශයෙන් දක්වා ඇති ප්‍රමාණවල ඇති සම්බන්ධතා අනුව යම් ආකාර සම්බන්ධතාවක් ස්ත්‍රියකට පිරිමියා අතරෙහි ඇති අවස්ථාවක සහ එම ස්ත්‍රිය වයසින් අවුරුදු දහසයට අඩුවන විට, ඒ ස්ත්‍රිය දූෂණය කරන කවර හෝ තැනැත්තකුට, වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහළොවකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් යුතු දඬුවමකින් දඬුවම් කරනු ලැබිය යුතු ය.



(4) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ගෙවන ලෙස තමාට ආඥා කරන ලද වන්දි මුදල ගෙවීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ ඔහු වෙත නියම කරනු ලැබූ බන්ධනාගාරගත කිරීමට අතිරේකව අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.".

"බාලවයස්කාර ගැහැණු ළමයින් සමග ලිංගික සංසර්ගය" යන ශීර්ෂ පාඨය ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 364අ වගන්තියට ඉහතින් වූ ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 364අ වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 364අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"ව්‍යභිචාරය.

364අ. (1) පහත වෙන් වෙන් වශයෙන් දක්වා ඇති ප්‍රමාණවල ඇති සම්බන්ධතා තමාට ඇති වෙනත් තැනැත්තකු, එනම්—

(අ) දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක්, අනෙක් පාර්ශ්වයෙන් කෙළින්ම පැවත එන තැනැත්තකු හෝ තමා දරුකමට හදා ගැනීමට ගත් දෙමව්පියන්ගෙන් කෙනකු හෝ තමා දරුකමට හදා ගැනීමට ගත් සීයාගෙන් හෝ ආච්චිගෙන් කෙනකු හෝ දරුකමට හදාගත් ළමයකු හෝ දරුකමට හදාගත් මුණුබුරකු හෝ මිණිබිරියක වන්නේ නම්;

(ආ) ස්ත්‍රී පාර්ශ්වය, පූර්ණ ලේ නෑකමින් හෝ අර්ධ ලේ නෑකමින් හෝ දරුකමට හදා ගැනීමෙන් හෝ පුරුෂ පාර්ශ්වයේ සහෝදරිය වන්නේ නම් හෝ, පූර්ණ ලේ නෑකමින් හෝ අර්ධ ලේ නෑකමින් හෝ දරුකමට හදා ගැනීමෙන් හෝ පුරුෂ පාර්ශ්වයේ සහෝදරයාගේ නැතහොත් සහෝදරියගේ දියණිය වන්නේ නම් හෝ, ඔවුන් දෙදෙනාගෙන් කෙනෙකු ගෙන පැවත එන තැනැත්තියක වන්නේ නම් හෝ, පුරුෂ පාර්ශ්වයේ භාර්යාවට වෙනත් පියකුට දාව ලැබුණු දියණියක් වන්නේ නම් හෝ ඔහුගේ පුතාගේ නැතහොත් මුණුබුරාගේ නැතහොත් පියාගේ හෝ සීයාගේ වැන්දඹුව වන්නේ නම්; හෝ

(ආ) පුරුෂ පාර්ශ්වය, පූර්ණ ලේ නෑකමින් හෝ අර්ධ ලේ නෑකමින් හෝ දරුකමට හදා ගැනීමෙන් හෝ ස්ත්‍රී පාර්ශ්වයේ සහෝදරයා වන්නේ නම් හෝ, පූර්ණ ලේ නෑකමින් හෝ අර්ධ ලේ නෑකමින් හෝ දරුකමට හදා ගැනීමෙන් හෝ ඇගේ සහෝදරයාගේ හෝ නැතහොත් සහෝදරියගේ පුත්‍රයා වන්නේ නම් හෝ ඔවුන් දෙදෙනාගෙන් කෙනෙකුගෙන් පැවත එන තැනැත්තකු නම් හෝ ඇගේ ස්වාමිපුරුෂයාට දාව වෙනත් මවකට ලැබුණු පුත්‍රයකු වන්නේ නම් හෝ, ඇගේ මියගිය දියණියගේ හෝ මිණිබිරියගේ හෝ මවගේ හෝ ආච්චිගේ හෝ ස්වාමිපුරුෂයා වන්නේ නම්,

එවැනි තැනැත්තකු සමග ලිංගික සංසර්ගයෙහි යෙදෙන කවර හෝ තැනැත්තකු, "ව්‍යභිචාරී" වරද සිදු කරන්නේ යයි කියනු ලැබේ.

(2) මේ වගන්තියෙහි සඳහන් කර ඇති යම් නෑකම් සම්බන්ධතාවක නීත්‍යානුකූල භාවයෙහි යම් දෝෂයක්, එනම්, වලංගු විවාහයක් හෝ වලංගු දරුකමට හදා ගැනීමක් නොතිබීම වැනි දෝෂයක්, තිබීම හේතු කොටගෙන ව්‍යභිචාරී වරද කෙරෙහි බලපෑමක් හෝ ඒ වරද ප්‍රතිෂේධ කිරීමක් සිදු නොවන්නේ ය.

(3) (අ) ව්‍යභිචාරී වරද සිදු කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමෙන් සහ දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු ය ;

(ආ) ව්‍යභිචාරය සිදු කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) නීතිපතිවරයාගේ ලිඛිත අනුමතය ඇතිව මිස, මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් ආරම්භ කරනු නොලැබිය යුතු ය.".

"අස්වාභාවික වැරදි" සහ ශීර්ෂ පාඨය ප්‍රතියෝජනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 364අ වගන්තියට ඉක්බිතිව ම දැක්වෙන ශීර්ෂ පාඨය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂ පාඨය ආදේශ කරනු ලැබේ :—



" අස්වාභාවික වැරදි සහ බරපතල ලිංගික අපයෝජනය ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 365 වන වගන්තියේ, "දඬුවම් කළ යුතු අතර, ඔහු දඩයකට ද යටත් වන්නේ ය" යන වචන වෙනුවට "සහ දඩයකින් ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු අතර ඒ වරද වයස අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් වයස අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් සිදු කරනු ලබන අවස්ථාවක, අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

"තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා.

365අ. ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හෝ වෙනත් තැනැත්තකු සමග යම් දැඩි අශිෂ්ට ක්‍රියාවක් සිදු කරන නැතහොත් එවැනි යම් ක්‍රියාවකට පාර්ශ්වකරුවකු වන හෝ, එබඳු යම් ක්‍රියාවක් යම් තැනැත්තකු විසින් කරනු ලැබීම කුට්ටනය කරන හෝ කුට්ටනය කිරීමට තැත් කරන කවර හෝ තැනැත්තකු වරදකට වරදකරු වන අතර, ඔහුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද ඒ වරද වයස අවුරුදු දහඅටකට වැඩි තැනැත්තකු විසින් වයස අවුරුදු දහසයකට අඩු තැනැත්තකු සම්බන්ධයෙන් සිදුකරනු ලබන අවස්ථාවක, අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ඒ තැනැත්තාට දඬුවම් කරනු ලැබිය යුතු ය. තවද ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙසද අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය ඇතුළත් කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 365අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"බරපතල ලිංගික අපයෝජනය.

365ආ. (1) ලිංගික තෘප්තිය ලබා ගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් පාවිච්චි කිරීමෙන්, පහත දැක්වෙන විස්තර අතුරින් යම් විස්තරයකට අයත් පරිවේෂණ යටතේ, එනම්—

(අ) ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත නොමැතිව ;

(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, තර්ජනය කිරීමෙන් හෝ බිය ගැන්වීමෙන් ඒ අනෙක් තැනැත්තාට මරණ භය හෝ තුවාල සිදුකිරීමේ භය ඇති කිරීමෙන් හෝ, ඒ අනෙක් තැනැත්තා නීති විරෝධී ලෙස රඳවා ගෙන සිටිය දී හෝ ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත ලබා ගෙන ඇති අවස්ථාවක එසේ ලබාගත් කැමැත්ත ඇතිව ;

(ඇ) අනෙක් තැනැත්තා සිහිවිකලව සිටිය දී හෝ මද්‍යසාර නැතහොත් මත් ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඒ අනෙක් තැනත්තා සිටිය දී ඒ අනෙක් තැනැත්තාගෙන් ලබාගත් කැමැත්ත ඇතිව

363 වන වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය සංඝටිත නොවන යම් ක්‍රියාවක් කරන තැනැත්තෙක් "බරපතල ලිංගික අපයෝජනය" සිදු කරන්නේ ය.

(2) (අ) බරපතල ලිංගික අපයෝජනය සිදු කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු පහකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි ය ;

(ආ) වයස අවුරුදු දහඅටකට අඩු තැනැත්තකු සමග බරපතල ලිංගික අපයෝජනය සිදු කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලය



කට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකින් සහ දඩයකින් දඬුවම් කළ යුතු අතර, ඒ වරද සිදු කරන ලද්දේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන මුදලක වන්දියක් ඒ තැනැත්තාට ගෙවන ලෙස ද අධිකරණය විසින් අණ කරනු ලැබිය හැකි ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ශීර්ෂ පාඨය මෙයින් ඇතුළත් කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 365ආ වගන්තියට ඉක්බිතිව ම "ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම" යන ශීර්ෂ පාඨය ඇතුළත් කිරීම.

"ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ "ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම" යන ශීර්ෂ පාඨයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 365ඇ වගන්තිය ලෙස බල පැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 365ඇ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

"ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම.

365ඇ. (1) 345 වන වගන්තිය හෝ 360අ වගන්තිය හෝ 360ආ වගන්තිය හෝ 363 වන වගන්තිය හෝ 364අ වගන්තිය හෝ 365 වන වගන්තිය හෝ 365අ වගන්තිය හෝ 365ආ වගන්තිය හෝ යටතේ යම් තැනැත්තකුට එරෙහිව වරදක් සිදුකර ඇතැයි කියනු ලබන්නේ ද නැතහොත් වරදක් සිදු කර ඇති බව සොයා දැන ගෙන ඇත්තේ ද (මෙහි මින් මතු "ගොදුරු වූ තැනැත්තා" යනුවෙන් මේ වගන්තියේ සඳහන් කරනු ලබන) ඒ තැනැත්තාගේ නම හෝ ඒ තැනැත්තාගේ අනන්‍යතාව හෝ එළිදරව් වන යම් කාරණයක් මුද්‍රණය කරන නැතහොත් පළ කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) ගොදුරු වූ තැනැත්තාගේ නම හෝ ඒ තැනැත්තාගේ අනන්‍යතාව එළිදරව් වන යම් කාරණයක් හෝ මුද්‍රණය කිරීම හෝ පළ කිරීම—

(අ) ඒ වරද පිළිබඳව විමර්ශණ පවත්වන පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් හෝ විමර්ශණය පවත්වන පොලිස් නිලධරයා විසින් හෝ ඔහුගේ නියමය යටතේ හෝ සද්භාවයෙන් ක්‍රියා කරමින් ඒ විමර්ශණයේ කාර්ය සඳහා කරනු ලබන්නේ නම් ; හෝ

(අ) යොදුරු වූ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාගේ ලිඛිත අවසරය යටතේ කරනු ලබන්නේ නම් ; හෝ

(ආ) යොදුරු වූ තැනැත්තා මිය ගොස් ඇති අවස්ථාවක, ඒ තැනැත්තාගේ ළඟම ඥාතියා විසින් හෝ, ඒ තැනැත්තා බාල වියස්කරුවකු නැතහොත් සිහිවිකල තැනැත්තකු වන අවස්ථාවක, ඒ තැනැත්තාගේ දෙමව්පියන්ගෙන් කෙනකු නැතහොත් භාරකරු විසින් දෙන ලද ලිඛිත අවසරය ඇතිව කරනු ලබන්නේ නම්

එවැනි මුද්‍රණය කිරීමකට හෝ පළ කිරීමකට (1) වන උපවගන්තියේ ඇතුළත් කිසිවක් අදාළ නොවිය යුතු ය ;

එසේ වුවද, රජය විසින් පිළිගන්නා ලද සමාජ සුභසාධන ආයතනයක හෝ සංවිධානයක, කවර හෝ ආකාරයකින් විස්තර කරනු ලබන එහි සභාපතිවරයා, ලේකම්වරයා හෝ කළමනාකාරවරයා නොවන වෙනත් යම් තැනැත්තකුට, ඒ ළඟම ඥාතියා විසින් ඒ අවසරය දෙනු නොලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නඩු කටයුත්තකට අදාළ යම් කරුණක්, ඒ අධිකරණයේ පූර්ව අනුමතය නොමැතිව මුද්‍රණය කරන හෝ පළ කරන කවර හෝ තැනැත්තකුට අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

පැහැදිලි කිරීම—
අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ තීන්දුවක් මුද්‍රණය කිරීම නැතහොත් පළ කිරීම, මේ වගන්තියේ අර්ථානුකූලව වරදක් නොවන්නේ ය.".

22. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතා ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.